**බදුල්ල චෙන්කලාඩි මාර්ගය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය - 2015**

**----------------------------------------------------------------------**

බදුල්ල චෙන්කලාඩි මාර්ගය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් පළමු ගිණුම් කාලපරිච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල (OFID) සහ සවුදි සංවර්ධන අරමුදල (SFD) අතර 2015 ජුනි 26 හා 2015 ඔක්තෝබර් 30 දින එළඹි අංක 1661 පී සහ 10/639 දරන ණය ගිවිසුම් යටතේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

**----------------------------------------------------------------------**

ව්‍යාපෘතියේ ණය ගිවිසුම් අනුව, උසස් අධ්‍යාපන හා මහා මාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණ වන්නේ මධ්‍යම හා ඌව පළාත් සමඟ නැගෙනහිර පළාතේ සම්බන්ධතාවය වැඩිදියුණු කිරීම හා ප්‍රවාහනය වැඩි දියුණු කිරීම සහ එම පළාත්වල ආර්ථික කටයුතු ඉහළ නැංවීමයි. කොන්ත්‍රාත් ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා මාර්ගයේ කිලෝ මීටර් 147 ක් වූ මුළු දිග බදුල්ල සිට බිබිල සහ බිබිල සිට චෙන්කලාඩි යනුවෙන් සංරචක දෙකකට වෙන් කරන ලදි. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 18,200 කට සමාන එජඩො මිලියන 140 ක් වන අතර රු.මිලියන 7,800 කට සමාන එජඩො මිලියන 60 ක් මූල්‍යායනය කිරීමට ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල හා රු. මිලියන 7800 කට සමාන එජඩො මිලියන 60 ක් සවුදි සංවර්ධන අරමුදල මූල්‍යායනය කිරීමට එකඟවී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු සංරචක ඒ සහ සංරචක බී යටතේ 2016 අගෝස්තු හා 2016 සැප්තැම්බර් මාසයේදී ආරම්භ කරන ලද අතර පිළිවෙලින් 2019 පෙබරවාරි හා 2019 මාර්තු වන විට නිම කිරීමට නියමිතය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක, සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

**--------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස්

නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උපදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරික්ෂා කිරීම්ද එම පරික්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල, ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජයේ අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම් ණය වලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුම් වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව. සහ

(ඌ) ණය ගිවිසුම් වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**2. මූල්‍ය ප්‍රකාශන**
**----------------**

**2.1 මතය**
**------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2015 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව, සහ

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බවත්ය.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය, 2015 දෙසැම්බර් 31 දිනට අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම අනුව මූල්‍යයනය සඳහා එකඟවූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරීම | 2015 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කළ අරමුදල් |
|---|---|---|---|---|
| | එජඩො මිලියන | රු.මිලියන | රු. මිලියන | රු.මිලියන |
| ණය සපයන නියෝජිතායතනය | | | | |
| - ඕඑෆ්අයිඩී | 60 | 7,800 | - | - |
| - එස්එෆ්ඩී | 60 | 7,800 | - | - |
| ශ්‍රීලංර | 20 | 2,600 | 424.20 | 424.40 |
| | 140 | 18,200 | 424.40 | 424.40 |

### 3.2 භෞතික ප්‍රගතිය

පහත නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) සැලසුම් කරන ලද ව්‍යාපෘති කාල පරිච්ඡේදය තුළදී වෙන් කරන ලද සම්පත් යොදා ගනිමින් ව්‍යාපෘති අරමුණු ඉටුකර ගැනීම තහවුරු කර ගනු වස්, සමස්ත ව්‍යාපෘති කාල පරිච්ඡේදය ආවරණය වන පරිදි මාසික, කාර්තුමය හා අර්ධ වාර්ෂික ආදී වශයෙන් වගකීම් දක්වමින් මූල්‍ය හා භෞතික ඉලක්ක මතු කර දක්වමින් පරිපූර්ණ විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ආ) ලබාගත හැකි වූ තොරතුරු අනුව, ව්‍යාපෘතිය 2009 වර්ෂයේ සිට ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු වල නිරතවී තිබුණි. එබැවින් සමාලෝචිත වර්ෂය තුළ බදුල්ල, පස්සර, බිබිල හා රිදීමාලියද්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල හෙක්ටයාර් 43.42 ක රජයේ ඉඩම් ඇතුළත්ව හෙක්ටයාර් 59.28 ක ඉඩම් අත්පත් කර ගැනීම සඳහා හඳුනාගෙන තිබුණි. කෙසේ වුවද, අත්පත් කර ගැනීමට අපේක්ෂිත ලුණුගල, පදියතලාව, මහඔය හා එරාවුර්පත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ඉඩම් හඳුනා ගැනීමට 2015 දෙසැම්බර් 31 දිනට කටයුතු කර නොතිබුණි.

### 3.3 මතභේදයට තුඩුදෙන කරුණු

ව්‍යාපෘතියේ කාර්යයන් ආරම්භ කිරීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය විසින් දේශීය බලපත්‍රලාභී විශේෂිත බැංකුවකින් ලබාගත් රු.මිලියන 2.54 ක ණය මුදල් උපයෝජනය කර තිබුණි. කෙසේ වුවද, ණය ආපසු ගෙවීම පිළිබඳ සැලැස්ම විගණනයට පැහැදිලි කර නොතිබුණි.